**වසර තිස්පහක කාලයක් විදේශයක ගත කළ කාලය මට දැන් දැනෙන්නේ දුම්වැටියක් පානය කළා හා සමානවය. එය ඉතා සොඳුරු ආශ්වාදයක් මොහොතකට ලැබ්දී ඉක්මණින්ම අවසානය කරා ඇදී ගියා සේය.......**

# අපේ අම්මා



අම්මා මිටි අසුනක හිඳගෙන මේසය උඩ ඇති රේඩියෝව දෙසට වැදගෙන බණ අසමින් සිටින්නීය. ඇගේ හිසේ එකදු කලු හිසකෙස් ගසක්වත් පෙනෙන්නට නැත. මුවෙහි එකදු දතකුදු නැත. නිතරම මුවෙහි උඩු ඇන්ද වමටත්, යට ඇන්ද දකුණටත් කරකවයි. එහෙත් බුලත් විට නොකයි. ඇය උස්ය. හීන්දෑරිය. එසේම කළුය. වැඩිය නොදොඩයි. ඒ වෙනුවට නිතර හිනැහෙයි. ඒද නිහඬවය. බෙහෝ වයසක උදවිය මෙන් අතීතය එතරම් අතපත නොගායි. එහෙත් දැන් කළ යුතු දේ දැන් කරයි.

රේඩියෝවේ ධර්ම දේසනාව දිගටම ඇසෙයි. අම්මා ඉතා ඕනෑකමින් ධර්ම දේසනාවට ඇහුම්කන් දෙයි. වචනයකට පවා ඉවත යාමට ඉඩ නොදෙන අයුරින් ඇය දැහැන් ගතව සිටින්නීය. ඇයගේ ඇස් පෙනීම මදක් අඩු වුවද, කන් ඇසීම තියුණුය. මුහුද දෙස බලා ගෙන කෙතරම් කාලයක් වුවද ගත කිරීමට මට පුළුවන. අපේ අම්මාද මුහුදකි. ඒ ඇය දෙස බලා සිටින විට මට දැනෙන්නේ මා මුහුද දෙස බලා සිටින විට දැනෙන සිතුවිලිම නිසාය. විටෙක ඇය කවියකි. තවත් විටෙක සුන්දර සිතුවමකි.

වයස අවුරුදු පහක් වන තුරුම අම්මාගේ දෙතනින් කිරි බිව් හෙයින් මට ඇයගේ කිරිසුවඳ පවා තවම මතකය. කුඩා කළ මා නහවා, පළමුව සබන් ගා දෙවනුව ගලකින්ද තෙවනුව රෙදි කැබැල්ලකින්ද කුණු ඇතිල්ලූ අයුරුද මතකය. බෙලෙක් කෝප්පයකින් වතුර නවා ඇය මගේ පස්ස පැත්ත සෝදන විට කමිසයේ යටි කෙළවර ගුලිකොට උදරයට තද කරගෙන දෙපා අතරින් ගලා එන වතුර පාර දෙස මම බලා සිටියෙමි. වතුර පාර නැවතුනු පසු මම නැගිට කලිසම ඔසවා ගතිමි.

පළමුව මා පාසල් ගිය දා වක්කඩ කැඩුවා සේ මගේ දෙනෙතින් කඳුළු ගලා යන විට ඇය අද මෙන්ම අවිහිංසක ලෙස සිනාසුනාය. එදා මට සිතුණේ ඇය කඳුළු නොසැලුවේ ඇය මට වඩා අනෙක් සහෝදර සහෝදරියන්ට ආදරය ඇති නිසා කියාය. පහේ පංතියේ අන්තිමයා වී ගෙදර පැමිණි දා ඇය මට අන් සහෝදර සහෝදරියන්ට වඩා වැඩිපුර බත් බෙදා දුන්නාය. වෙනදා කටට දෙකට බත් පිඟාන අවසන් කරන මා එදින බත් පත අත පත ගාන බව දැක ඇය කිසිවක් සිදු නොවූ අයුරින් මට බත් කැව්වාය.

හොරෙන් සීනි කෑමට ගොස් පුටුව පෙරළී බිම ඇද වැටී මගේ අත විසන්ධි වූ දා ඇය මා ඔසවාගෙන වෙද ගෙදරට දිව ගියාය. එහෙත් මට දොස් නොකීවාය. පත්තු බැඳගෙන යළි නිවසට ආ කල්හි ඇයගේ අල්ල පුරාවට ගත් සීනි අහුරක් මගේ මුවට දැම්මාය. මම වරද කරුවෙකු ලෙස ඇයගේ දෙනෙත දෙස බලමින් සීනි කෑවෙමි. එදින ඇය මදෙස බලා සිටි අයුරු මට තවමත් මතකය. එහෙත් එදින කෑ සීනි වල රස අමතකය.

ලොකු අය්යා දියේ ගිලී මිය ගියදා ලෝකයම මා ඉදිරියේ කඩා වැටුණාක් මෙන් මට දැනිණි. මා ඉකි ගසමින් හඬමින් සිටින විට මාව ඇයගේ තුරුලට ගෙන ඇයගේ සාරි පොටෙන් සෙමෙන් කඳුළු පිස දාගත්තාය. මා විශ්ව විද්‍යාලයට තේරුණු පුවත අසා ඇය මට ආශිර්වාද කර සතුටු වූවාය. එහෙත් ආඩම්බර නොවූවාය. ලොකු අක්කා විවාහ වී පිටගම් ගියදා මගේ හදවත කඩා වැටුණි. සුපුරුදු පරිදි එදිනද ශෝකය දරා ගැනීම මට උගහට විය. අක්කාත්, මමත් කැලේ අඹුල් පේර කැඩූ හැටි මට මතක් විය. ඇය සමඟ අඬ දඹර ඇති කරගෙන නැවතත් යාළු වූ හැටි මට මතක් විය. අතීතය සැමරුම් යනු ජීවිතය දැඩි ලෙස කළඹා පෙළනු ලබන දෙයක් වුවද, එදින අම්මාගේ දෑස සියුම් සතුටු කඳුළු පටළයකින් වැසී දිලුණේය.

මගේ මුල් පත්වීම ලද දින ඇය සතුටු විය. මා විදේශගතවූදා ඇය දුක් නොවීය. සතුටත්, දුකත් ඇය සේ සමබරව විඳි අයෙක් මගේ ජීවිත කාලය තුළදී මට හමු වී නැත. දහස් ගණනක් පොත් පත් කියවා මට ලබා ගැනීමට නොහැකි වූ දැණුමක් ඇය ලැබුවේ කෙසේදැයි යන්න අදටත් මා කෙරෙහි ඇති කරනුයේ නොවිසඳු ප්‍රේහේලිකාවකි.

අප්පච්චී මෙන් නොව ඇය ළෙඩ දුක් තඹ සතයකටවත් මායිම් නොකළාය. බඩේ අමාරුවක් හැදුණු විට ඇය කළේ වීදුරු බෝතලයකට උණු වතුර දමා ඇගේ උදරය තවා ගැනීමය. උණක් හෙම්බිරිස්සාවක් හැදුණු කළ ඇය වෙනිවැල්ගැට කොත්තමල්ලි ටිකක් තම්බා බොන්නීය. එයද බොහෝ කලාතුරකිනි.

මා විදේශීය කාන්තාවක හා විවාහ වී අම්මාත්, අප්පච්චිත් බැලීමට නිවසට ආ දා අප්පච්චී මා සමඟ කථා නොකළ තරම්ය. එහෙත් අම්මා සුපුරුදු පරිදි මා හා දෙඩුවාය. ආ ගිය තැන් විචාලේය. මගේ බිරිඳගේ සිත නොරිදවා කටයුතු කළාය. වසර දෙක තුනකට වතාවක් ලංකාවට ආ ගිය මගේ පවුලත්, අම්මා අප්පච්චීත් අතරත් වෙන් නොකළ හැකි තරමේ සබඳතාවයක් නොතිබුණේය. එහෙත් විවාහ වී මා ගෙවූ පසුගිය වසර තිස්පහක කාල සීමාවේදී සිතින් මා අම්මාට තවතවත් ළංවූවා සේ මට දැනුනු වාර බොහෝය.

වසර තිස්පහක කාලයක් විදේශයක ගත කළ කාලය මට දැන් දැනෙන්නේ දුම්වැටියක් පානය කළා හා සමානවය. එය ඉතා සොඳුරු ආශ්වාදයක් මොහොතකට ලැබ්දී ඉක්මණින්ම අවසානය කරා ඇදී ගියා සේය. මම සුන්දර කාන්තාවක හා විවාහ වුණෙමි. මිතුරු මිතුරියන් සමඟ කෙළිදෙළෙන් කාලයද ගත කළෙමි. පිළිගත් රැකියාවක් කළෙමි දිවා රෑ නොබලා මුදල් හරි හම්බ කෙරුවෙමි. සුවිසල් නිවසක් සැදුවෙමි. ලොව පුරා සංචාරය කළෙමි. අති සුබෝපභෝගී වාහන මිලදී ගතිමි. පියකරු දරුවෝ තිදෙනෙකුට පියෙකු වුණෙමි. ඔවුහු උගෙන රැකියාවන් සොයාගෙන ආවාහ විවාහ වෙනුද දුටුවෙමි. හැමදෙයකටම වඩා අන් අය අතර කැපී පෙනන සේ ජීවිතය ගෙවීමට තරම් එක් අතකින් වාසනවන්ත විමි. සියල්ල අවසානයේ අනපේක්ෂිත ලෙස අංශභාගය සැදී මම එක්තැන් විමි.

මෙතුවක් කල් මා හා දුක සැප බෙදා ගත් බිරිඳට මගේ කටයුතු කිරීම එතරම්ම පහසු නුවූයෙන් දීර්ඝ කතාබහකින් අනතුරුව වැඩිහිටි නිවාසයක පදිංචියට යාමට මම කැමති වුණෙමි. ඒ ගියේද මා සිතැගි පරිදි සැප විහරණය කිරීමට සාදා ගත් නිවසෙහි බිරිඳ පමණක් තනි කර දමමිනි. ගත අබලන් වුවද සිත තවමත් එසේ නොවූ නිසාවෙන් මගේ නිවස මගේ දසුන් පතයෙන් ඉවත් වන මොහොතේ මට දැනුනේ එය මගේ අවසන් ගමන ලෙසය. මා ඉතා දුක් මහන්සියෙන් සහ ආශාවෙන් එක් රැස් කළ සියලු දේ ජීවත්ව සිටියදීම මට අහිමිව තිබේ. මා ඉපැදුනු ලංකාව හැර දමා යන විට මට නොදැනුනු අතිශ්‍ය පීඩාකාරී මහා දුක්ඛ දෝමනස්ස සහගත හැඟුමන් පැමිණ මා හද මඬළ කඩා බිඳ හළ සේය.

"පිංවතුනි, ඔබට ටිකක් අත්හරින්න පුළුවන් වුණොත් ටිකක් සැප විඳින්න පුළුවනි.... ගොඩක් අතහරින්න පුළුවන් වුණොත් ගොඩක් සැප විඳින්න පුළුවනි... සියල්ලම අත හරින්න පුරුදු වුණොත්....?" ගුවන්විදුලියේ බණ දේශනා කරන ස්වාමීන් වහන්සේ අපෙන් අසයි.... එහෙත් පිළිතුරු නොදෙයි .... අසන්නාටම සිතන්නට ඉඩ දෙයි.

මට මගේ දරුවන් මතක් විය. අනතුරුව බිරිඳ මතක් විය. කොහොම අතහරින්නද ? අම්මා තවමත් උක්කුට්ටියෙන් වාඩි වී බණ අසමින් සිටින්නීය. ඇයට නම් දැන් අතහැරීමට කියා කිසිවක් නැත. ඇයගේ සහෝදර සහෝදරියන්ගෙන් වැඩි පිරිසක් දැන් මිය පරලොව ගොසිනි. සැමියාද නැත. දරුවන් හත් දෙනෙකුගෙන් දැන් ඉතිරිව සිටින්නේ තවත් තිදෙනෙක් පමණි.

තාත්තාගේ මලගමේදී මගේ දෙනෙතින් පස්චාත්තාපය සහ යුතුකම් පැහැර හැරීමෙන් රත්වූ කඳුළු සිරස්ව ගළා නොගොස් තිරස්ව ඉදිරියට විද්දේය. එහෙත් අම්මා ඉකිබිඳ කඳුළු නොසැලුවාය. අම්මාගේ දෙනෙත දීප්තිමත්ව දිදුලුවේ අක්කාගේ විවාහය දා සේමය. වෙනෙසකට වූයේ අක්කාගේ විවාහය දා ඈ වත ඇදි අපේක්ෂාවේ සටහන් මෙදා උපේක්ෂා සහගත සටහනකට හැරී යාමය. මළගමේ සියලු කටයුතු අවසන් වූ විට නැවතත් විදේශගත වීමට පෙර මම අම්මා අම්මාගෙන් නොඅසා ඇසූ ප්‍රශ්නය වටහා ගත් ඇය මට මෙසේ කීවාය. පුතේ අපි බණ දහම් තේරුම් ගත්ත මිනිස්සු. ඉතිං මේ වගේ වෙලාවට පිළිපදින්න බැරිනම් බුදු බණෙන් ඇති වැඩේ මොකක්ද? අප්පච්චි ඉන්නකම් මම අප්පච්චිට හොඳින් සැළකුවා. මගේ අම්මට අප්පච්චිටත් සැළකුවා. උඹළටත් සැළකුවා. කවදාවත් මගේ හිතේ කැත කුණු අතගෑවා කියලාවත්, වැඩියෙන් වැඩ කළා කියලවත් දුකක් ඇති වුණේ නැහැ. මං ඇති තරම් පිංකරගෙන තියෙනවා පුතේ. එහෙව් එකේ මං මොකට හැපිලා වැටිලා අඬන්නද ?

වැඩිහිටි නිවාසයේදී අපව නිතර නිතර නොයේක් තැන් වල සංචාරයේ කැඳවාගෙන ගියේය. මම අන් අය හා නිතර දෙවේලේ නොයේකුත් උත්සව අවස්ථාවන්ටද සහභාගී වුණෙමි. හැකි අවස්ථාවන් වලදී මගේ බිරිඳත්, දරුවනුත් මා බැලීමට ආවෝය. බොහෝ දෙනා අතර ගත කළද මට දැණුනේ දරාගත නොහැකි පාළුවකි. තනිකමකි. තනි වුනු කල්හි මගේ සිතට නිතර නිතර ආ මතකයන් අතර අම්මාට ලැබුණේ මුල් තැනකි. සිහිනෙන් පවා මා දුටුවේ අම්මාගේ රැවය. ඇසුණේ අම්මාගේ හඬය. තවත් එක් වරක් හෝ අම්මා දැක ගෙන මිය යාම වුවද මට මහත් සැනසිල්ලට කාරණායක් විය. එබැවින් වෛද්‍යවරුන්ගෙන් සහ පවුලේ අය සහ මිතුරන්ගෙන් එළැඹි සියලු බාධක ඉවතලා ලංකාවට ඒමට මට තීරණය කළෙමි. අවසානයේ මගේ කුඩා දියණිය මා ලංකාවට කැටුව ඒමට කැමති වූවාය.

රෝද පුටුවකින් මම නැවත අම්මා බැලීමට මහ ගෙදරට එද්දී මගේ දෙනෙත කඳුළින් බොඳව තිබුණාද, අම්මා මා පිළිගත්තේ සුපුරුදු පරිද්දිය. මාගේ පැමිණීමෙන් ඇය සතුටු වූවාය. එහෙත් මගේ රෝගී තත්ත්වය ගැන විස්සෝප නොවූවාය. මම දෑත එක්කර අම්මාට වැඳීමට උත්සාහ කළෙමි. එහෙත් මගේ අත් මට දැන් අවනත නැත. ඒ දුටු අම්මා නැමී මගේ අත් දෙක එකතු කොට ඇයගේ පපුවට තුරුළු කොට "මගේ පුතාට රත්නත්තරේ පිහිටයි" කියා කීවාය. මා මෙන්ම මගේ දියණියද කඳුළු සැලූ නමුදු අම්මා එසේ නොකළාය.

මගේ සියලු උපස්ථාන කටයුතු කිරීමට කලින් සූදානම් කරගත් පරිදි හෙදියක් පැමිණ සිටියද, අනු දෙහැවිරිදි අම්මාද හැකි හැම විටම හැත්තෑ වියැති මට ආහාර කැව්වාය. තෙල් බෙහෙත්ද ගෑවාය. කැත කුණු පවා අත ගෑවාය. මා නැවතත් කුඩා බිළිදෙකු සේ අම්මාගෙන් සැළකුම් ලබයි. වෙද මහතෙකු දිනපතා නිවසටම ගෙන්නා ඇය මට සිංහල වෙදකම්ද කරන්නීය. මට ඇති හැකි දා ඇයගේ දෙපා පවා තවා නැති බැව් කල්පනා වූ විට මගේ ළය පැළී යාමට සැරසෙතැයි මට සිතුණි.

**තාත්තාගේ මලගමේදී මගේ දෙනෙතින් පස්චාත්තාපය සහ යුතුකම් පැහැර හැරීමෙන් රත්වූ කඳුළු සිරස්ව ගළා නොගොස් තිරස්ව ඉදිරියට විද්දේය. එහෙත් අම්මා ඉකිබිඳ කඳුළු නොසැලුවාය. අම්මාගේ දෙනෙත දීප්තිමත්ව දිදුලුවේ අක්කාගේ විවාහය දා සේමය. වෙනෙසකට වූයේ අක්කාගේ විවාහය දා ඈ වත ඇදි අපේක්ෂාවේ සටහන් මෙදා උපේක්ෂා සහගත සටහනකට හැරී යාමය.**

ඇය කිසිදිනක තමාගේ කවර හෝ දරුවෙකුගෙන් කවර වූ අඩුපාඩුවක්වත් තමන්ට සිදුවූ බවට මැසිවිලි නගා නැත. ඒ වෙනුවට හැකි හැම විටෙකම හැකි හැම කෙනෙකුටම වචනයකින් හෝ උදව්වක් මිස අවැඩක් කර ඇති බවක් මට මතක නැත. ඇය දෙඩුවේ තෝරා බේරාගත් වචන පමණි. කටු ඉවත් කොට දරුවෙකුට මාළු කවන මවක මෙන් අපේ අම්මාගේ වාග් කෝෂයද බොහෝ සෙයින් ප්‍රවේෂම් සහගත විය. ඇගේ ජීවිත කලයේ ඇය කථා කළ වචන ගණනට වඩා සිනාසුනු වාර ගණන වැඩි විය යුතුය.

මා කුඩා කළ මට අම්මා තරම් දන්නා කියන කෙනෙක් නොමැති විය. තරුණ අවධියේදී මට සිතුණේ අම්මාට වඩා මට දැනුම් තේරුම් ඇති බවය. දැන් මට නැවතත් සිතෙන්නේ අම්මා

( වන පිටුවට)

සාමන්ත තැන්නගේ
saamantha.tennege@gmail.com